## කෙටි කතාව

# සංවේගයෙන් දැනුම් දෙමි

එස්. සමරසේකර

*(අක්ෂර සෙනග 2009 සාහිත්‍ය තරගාවලිය - විවෘත අංශය- ජයග්‍රාහී කෙටිකතාව)*

**මනාලි පිට මැද්දට දමාගෙන තිබුණු හිස කෙස් එක්ක ගොයම් නිල්ලට හාදු දීගෙන ආපු හුළඟ කොලොප්පං කරන්න ගත්ත. ගොයම් නිල්ල දකිද්දි මනාලිගෙ හිත අතීතෙ ගල් පඩි පෙළ බැහැගෙන බැහැගෙන ගියා. එකෝමත් එක දවසක මනාලය ඈත් එක්ක හාදවුණු අලුත, ඈ ඒ යායෙ දනක් මඬේ එරී එරී ගොයම් නෙලුව. ඊට කලියෙං දවස් ගණනක් ගොයම් නෙලල, අන්තිමට නුහුරු වේදනාවකින් ඔද්දල් වුණු අතින් ඈ මනමාලයට ලියුම් ලියනකොට අකුරු ගොඩක් අපැහැදිලි වෙන්න ගත්ත.**
**මනාලිට හිතුනෙ නෑ කුලියට ගොයම් නෙලල අතේ අමාරුව නිසා අකුරු ඇදවෙන බව ලියන්න. ඈ ලියුවෙ අපේ කුඹුරෙ ගොයම් නෙලල අත රිදෙන නිසා අකුරු ඇදවෙන බවයි.**

"චක්ඛු ස්පර්ශයෙන් හටගත්තා වූ වේදනා තොමෝ ප්‍රිය ස්වභාව ඇත්තී වෙයි, මධුර ස්වභාව ඇත්තී වෙයි"
-ගෞතමයන් වහන්සේ-

එවිට එය එලෙස සිදු විය. මම එයට ඉඩ හළෙමි. විසි හතර වන වතාවටත් මා යන මග මැයි මල් වැටී වියළී ගියේය. එවිට ඇයට මම පෙම් කලෙමි.

ඉනික්බිති සත් වරක් මැයි ගස මල් දැරීය. සත් වරක් අප යන මග මල් සැලීය.

ඉනික්බිති එය සිදුවිය. අපි විවාහ වූයෙමු.

බොහෝ විට ගැඹුරු වූත්, ඇතැම් විට මාරාන්තික වූත් අර්බුදයක පැටලී සිටි මට, මගේ අක්ෂය වටා අංශක ස්වල්පයක් වත් දැනුවත්ව පැද්දීම දුෂ්කරව තිබිණි. එකල එක් රැයක් විය. මම සිහිනයක් දුටිමි.

සිහිනයට පරිමාවක්, හැඩක්, සුවඳක් හෝ ගඳක් පිළිවෙල හෝ අරමුණ නොවන බව මට කීවේ ඔබ නිසා, මා මෙතෙක් ලියූ අකුරු වැල් මා දුටු සිහිනයට ඔබ ලියූ පූර්විකාව වන්නේය.

මහත්වරුනි! සොළොස් වසකට පෙර මිය ගිය අත්තම්මා සුභ සිහින කිරි ගහටත්, අසුභ සිහින දෙහි ගහටත් පවසන ලෙස මට උගන්වා ඇති හෙයින්.....

මම කල්පනා කරමි.

සුභ හෝ අසුභ ලෙස වර්ග කල නොහැකි සිහිනයකි. අත්තම්මාද මිය ගොසිනි. එහෙයින් ඔබට කියමි.

අත්තම්මාගෙ මිනී වලෙහි
මිනී මල් ද මිය ගොසිනි.
පායනවා පායනවා
අපොයි මෙහෙම පෑවිල්ලක්.

★★★★★★★★★★

සාලංකාර ආරලු බූරලු මොකුත් නෑ. චාම් මංගල්ලයක්. ගෙවල් බිඳින්න යන හොරු කාණ්ඩයක්, නැත්තං මං පහරන්න යන මං පහරන්නො කාණ්ඩයක්. මංගල පෙරහැර ඒ වගෙයි.

මනමාලිගේ තාත්තා ඉස්සරහින්. ඊළඟට මනාලි, ඇගේ පස්සෙන් අම්මා. ඊට පස්සෙ මනාලයා මස්සිනත් එක්ක. පටුපාර දෙපැත්තෙ මල් ගස් වල දළු කඩ කඩ දෙමස්සිනෝරු දෙන්නා පාර මැද්දට ඒව දැම්ම. වචන වලින් කියන්න බැරි දිගම දිග කතාවක්.

දුවට පස්සෙන් යන අම්ම ඉක්මනින් අඩි තියනව. අවපාට කේඩෑරි අත්දණ්ඩෙ පටලෝගෙන දාඩියටම දියවෙච්ච ලේන්සු පොඩියෙන් වැහුණු සල්ලි කොළ අල්ලෙ ගුලි කරගෙන ඈ යනකොට ඇගෙ රබර් සෙරෙප්පු ජෝඩුව යටි පතුලෙ වැදිලා "ලටස් පටස්" ගෑව. හරියට මනමාලි තියන තියන අඩියට චීන පටස් ගහනව වගේ.

"අම්මට අලුත් සෙරෙප්පු ජෝඩුවක් ආයෙ එනකොට ගේනව" මනමාලයගේ හිත උගට කිවුවා. සත විසිපහේ කාසියක් ඒ සෙරෙප්පුවට පෑගුනොත් පෑගිලා තියෙන්නෙ සිංහ ද පොල්ල ද කියල කියන්න පුළුවන් තරමට එවුව ගෙවිල බව උගේ හිත උගට කිවු නිසා.
තාත්තගෙ ගමනෙ විශේෂ දුකක්වත් සතුටක්වත් පේන්න නෑ. ජීවිත කාලයක් දුකම හුරු උනහම ජීවත් වෙනව කියන්නෙ කියන්නෙ ඒකම නේද කියල හිතෙනවා.

කාටත්ම වගේ, තාත්තටත් දුක් විඳින්න ආසාවක් නොතිබුණු බව ඇත්ත. ඉස්සරම ඉස්සර දොළ ඉහත්තාවේ කිතුල් මැද්දෙත්, සිංහරාජේ දොරන තෙල් හින්දෙත් හැමදාම දුක් විඳින්න හිතාන නෙවී. හැමදාම පාංකලුවෙම හැර බැමි දිගේ ගස් ඇදෙන්න හිතාන නෙවී. දුක් විඳින එක අමාරු වැඩක් ය, ඕන නැති වැඩක් ය කියල තේරුං ගන්න එක ඒ මනුස්සයට මහ අමාරු කාරියක් නෙවි. ඒත් ඉතිං, කිතුල් මැදලත්, දොරන තෙල් හිඳලත් ඒ දුක් විඳින එක කෙලවරක් උනේ නෑ. ඊටපස්සෙ ඒ මනුස්සය සැප දලු නෙලන්න හිතාන තේ පැල හිටෙවුව.
එතකොට මනාලි පුංචි එකී. අම්ම නංගිට කිරි දෙනකොට, අම්ම තමන්ට ආදරේ නෑයි කියල හිතාන, අඬන්නෙ නැතුව නංගිගෙ රෝසපාට යටි පතුල් ඉඹල ඈව හිනස්සන්න තරං පැහිච්ච කමක් ඇට තිබුණා. එතකොට කටුමැටි තියපු, පොල් අතු හෙවිල්ලපු පුංචි පැලේ ජීවිත වල රිද්මය උනේ ඈ. ලොකු දුව, ලොකු නංගි, නැත්තං ලොකූ.

තේ පැල සාර සොබාවට හැදුන තමයි. පුංචි හුළඟටත් බයෙන් අප්පච්චිගේ දෑත් වලට තුරුළු උනා තමයි. ඒත් ලොකූ ගේ හිනාවකිං තරං අප්පච්චිගෙ, අම්මගෙ ජීවිත සැපවත් කරන්න ඒ තේ දලු වලට පුළුවං උනේ නෑ. එච්චර අවංක වෙන්න, එච්චර නොකිළිටි වෙන්න, ඒ තේ දළු වලට පුළුවන් උනේ නෑ.




සිංහරාජ වනන්තරේට ඉහළින් හඳ පායනකොට, කේමදාසගෙ ඇඟිලි තුඩු අගින් කිති කැවෙන වීණා තන්තු වල හඬින් දොළ දිය ගලාගෙන යන හඬ ඉස්තෝප්පුවේ වැල් ඇඳ උඩට වෙලා, බුලත් විටක් හප හපා අහං ඉන්න වෙන්නෙ නැති තරමෙ සිංහරාජෙ තුරු හිස් අතරෙ හැංගිලා මැදියම් ජාමෙටත් උල ලේන්නු නගන ශුද්ධ වූ ඕංකාරය නෑහෙන තරමෙ සැපයක් නෙවි අප්පච්චි බලාපොරොත්තු උනේ, අම්ම බලාපොරොත්තු උනේ.

වංගු වංගු වක රැලි ගහගෙන, පුංචි පුංචි ගල් කුළු අතරින් ලිස්ස ලිස්ස අඩි තිය තිය, වන වදුළු අතරින් තැනින් තැන දී පාරට එබිකම් කර කර, මංගල පෙරහැර ගැන මූදට කේලම් කියන්න ඔත්තු මාරු බලාපු දොළ ඔක්කොම බලාගත්තයින් වෙන්නැති කෙලින්ම ගලාගෙන ගියා නිල්ලට නිල්ලෙ දිලෙන ගොයම් නිල්ල මැදින්, තැනින් තැන හිනාවෙවී උන් මානෙල් මල් නලෝ නලෝ.

මනාලි පිට මැද්දට දමාගෙන තිබුණු හිස කෙස් එක්ක ගොයම් නිල්ලට හාදු දීගෙන ආපු හුළඟ කොලොප්පං කරන්න ගත්ත. ගොයම් නිල්ල දකිද්දි මනාලිගෙ හිත අතීතෙ ගල් පඩි පෙළ බැහැගෙන බැහැගෙන ගියා. එකෝමත් එක දවසක මනාලය ඈත් එක්ක හාදවුණු අලුත, ඈ ඒ යායෙ දනක් මඬේ එරී එරී ගොයම් නෙලුව. ඊට කලියෙං දවස් ගණනක් ගොයම් නෙලල, අන්තිමට නුහුරු වේදනාවකින් ඔද්දල් වුණු අතින් ඈ මනමාලයට ලියුම් ලියනකොට අකුරු ගොඩක් අපැහැදිලි වෙන්න ගත්ත.

මනාලිට හිතුනෙ නෑ කුලියට ගොයම් නෙලල අතේ අමාරුව නිසා අකුරු ඇදවෙන බව ලියන්න. ඈ ලියුවෙ අපේ කුඹුරෙ ගොයම් නෙලල අත රිදෙන නිසා අකුරු ඇදවෙන බවයි.

මනාලි පිටිපස්ස හැරිල මනාලයා දිහා බැලුව. මනාලය ඔලුව උස්සල මනාලි දිහා බැලුවෙත් එවෙලෙමයි. ගින්නට දාපු කපුරු පෙත්තක් ඇවිලුණා වාගේ මනාලිගෙ හිත එකපාරටම ඇවිලුණා. ජීවිතෙ ගැන ශූන්‍ය හැඟීමෙන් බොර පාට වෙලා තිබුණු ඒ ඇස්වල මොකක්දෝ බලාපොරොත්තුවක සහන් එළියක් ඈ දැක්ක.
සීරු මාරුවට අඩි තිය තිය යන මනාලි, ඈ ඇගෙ තලෙලු පාට මුහුණ බිමට නැඹුරු කරගෙනයි ඇවිද ගෙන ගියේ. ඒ තරං සාර සොබාවට හැදුණු තේ පැලයක් වගේ නූනත්, ඒ තරං දුකම විඳපු තේ පැලයක් නෙවෙයි, ඈ මහපොළොවත් එක්ක ගැටිල පදං වෙච්ච ඇඟකුයි ඈට තිබ්බෙ.

දවසක් මනාලිගෙ අයිය කොහෙන්දෝ තරාදියක් ගෙන්නල තිබ්බ. ඒ මොනව කිරන්නද කියල මනාලි දැන උන්නෙ නෑ. ඒත් ඈ දැන උන්න මෞලයට කිලෝප්‍රල් කිරන්න නොවෙන බව. මනාලිට හිතුණ මනාලයා ඈට එවපු ලියුම් කිලෝ කීයක් තියේද බලන්න. මනාලි තරාදි තට්ටුවට එවුව ටික දැම්ම. ඒත් අනිත් පැත්තට දාන්න පඩි තිබුණෙ නෑ. ඉතිං ඈ අනිත් පැත්තට රස්සාවලට ඉල්ලුම් කරපු ඉල්ලුම්පත්තර ටික දැම්ම. හරි පුදුමයි! දෙපැත්තම සමබරේට තිබුණ. අවුරුදු හතක් තිස්සෙ ලියාපුව. මනාලි දැන උන්න, ඒ ලියුම් කන්දරාව අස්සෙ මැයි මල් පෙති හතක් අලවපු ලියුම් හතක් තියෙන විත්තිය.

මනාලය කවදාවත් මනාලිට මුකුත් දීලා තිබුණෙ නෑ. මැයි මල් පෙත්තකට වැඩි යමක් දෙන්න උගට වත්කමක් තිබ්බෙ නෑ. පුංචි තෑග්ගක් දෙන්න උගට හිත දුන්නෙ. ළඟදි දවසක මනාලය ඈ බලන්න එනකොට රුපියල් දහයකම බොම්බයි මොටයි ගෙනාවෙ ඒ හන්ද වෙන්න ඇති. පාට නිසා, ලාබ නිසා,

පසු පිටුවෙන් (අදිසි)